# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2327/33 - 2023 අප්‍රේල් මස 11 වැනි අඟහරුවාදා - 2023.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 6/2007(III)

### 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත

2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 වන වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඈ) වන සහ (ඉ) වන ඡේද සමග කියවිය යුතු එකී පනතේ 67 වන වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කංචන විජේසේකර,**
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2023 මාර්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. මෙම නියෝග 2023 අංක 01 දරන උපකරණවල බලශක්ති කාර්ය සාධන ප්‍රමිති (ශීතකරණ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් අනුමත කරන ලද ශ්‍රී ලංකා ප්‍රමිති (එස්.එල්.එස්) 1690 හි නිශ්චිතව දක්වා ඇති බලශක්ති කාර්ය සාධන ප්‍රමිතිවලට අනුකූල නොවන්නා වූ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ශීතකරණයක් ශ්‍රී ලංකාව තුළ එකලස් කිරීම හෝ නිෂ්පාදනය කිරීම හෝ ශ්‍රී ලංකාවට ආනයනය කිරීම හෝ නොකළ යුතු ය.

03. ශ්‍රී ලංකා ප්‍රමිති (එස්.එල්.එස්) 1690 හි නිශ්චිතව දක්වා ඇති බලශක්ති කාර්ය සාධන ප්‍රමිතිවලට අනුකූලවන්නා වූ, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ශීතකරණයක්, ශ්‍රී ලංකාව තුළ එකලස් කරනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සෑම තැනැත්තකු විසින් ම එම ශීතකරණය මත, මෙහි II වන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති සහ ශ්‍රී ලංකා ප්‍රමිති (එස්.එල්.එස්) 1690 හි නිශ්චිතව දක්වා ඇති ආකෘතිය, මිණුම්, අක්ෂර ප්‍රමාණ සහ වර්ණවලට අනුකූල වන්නා වූ අවම බලශක්ති කාර්ය සාධන (එම්.ඊ.පී) ලේබලයක් ප්‍රදර්ශනය කළ යුතු ය.

04. මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති එවැනි යම් ශීතකරණයක්, එකලස් කරනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන හෝ ආනයනය කරනු ලබන තැනැත්තකු විසින් එම ශීතකරණය ශ්‍රී ලංකා ප්‍රමිති (එස්.එල්.එස්) 1690 හි නිශ්චිතව දක්වා ඇති බලශක්ති කාර්ය සාධන ප්‍රමිතිවලට අනුකූලවන බවට සහතික කිරීමේ කාර්ය සඳහා, අවස්ථාවෝචිත පරිදි, එම ශීතකරණය එකලස් කරනු ලබන තැනැත්තා, නිෂ්පාදනය කරනු ලබන තැනැත්තා හෝ ආනයනය කරනු ලබන තැනැත්තා විසින් ශ්‍රී ලංකා ප්‍රමිති (එස්.එල්.එස්) 1690 හි නිශ්චිතව දක්වා ඇති බලශක්ති කාර්ය සාධන ප්‍රමිතිවලට අනුකූලවන ආකාරයට එම ශීතකරණ එකලස් කර ඇති බවට නිෂ්පාදනය කර ඇති බවට හෝ ආනයනය කර ඇති බවට සහතික කරමින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන සහතිකයක්, අධිකාරිය විසින් ඉල්ලා සිටි අවස්ථාවක දී එම සහතිකය අධිකාරියට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එවැනි සහතිකයක්, එහි අන්තර්ගත කරුණු පිළිබඳව බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

05. කිසිදු තැනැත්තකු විසින්, මේ නියෝගවල 3 වන නියෝගය මගින් පනවන ලද නියමයන්ට අනුකූල නොවන්නා වූ අවම බලශක්ති කාර්ය සාධන ලේබලයක් අලවා ඇති, ශ්‍රී ලංකාව තුළ එකලස් කරනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ශීතකරණයක් ගබඩා කිරීම, ප්‍රදර්ශනය කිරීම, තොග හෝ සිල්ලර වශයෙන් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙදා හැරීම සිදු කරනු නොලැබිය යුතු ය.

06. මෙම නියෝගවල -

''අධිකාරිය'' යන්නෙන්, 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අදහස් වේ;

''ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය'' යන්නෙන්, 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අදහස් වේ.

## I වන උපලේඛනය

(2, 3, 4, 5 වන නියෝග)

මෙම නියෝග පහත දැක්වෙන ශීතකරණ සඳහා අදාළ වේ.

නාමික විදුලි සැපයුම 230V වන්නා 50Hz මත ක්‍රියාත්මක වන අධිශීතකරණ සහ සිසිලන පහසුකම්වලින් සමන්විත සහ ස්වාභාවික සංවහනය හෝ බලය යොදවන වායු සංසරණ සහිත ගෘහස්ථ ඉලෙක්ට්‍රික් වාෂ්ප සංවහනය ස්වභාවයේ ශීතකරණ.

මෙම නියෝග පහත දැක්වෙන අයිතම සඳහා අදාළ නොවේ.

(අ) මේසය මත තබන ශීතකරණ;

(ආ) මුළුමනින්ම වාහන (උදා. ජංගම නිවාස, තවලම් සහ රේල් කාර්) තුළ භාවිතය සඳහා පමණක් නිර්මාණය කර ඇති ශීතකරණ;

(ඇ) ස්වයංක්‍රීය අයිස් කැට බෙදා හැරීම, ශීත කළ ජලය බෙදා හැරීම වැනි අමතර විශේෂාංග සහිත ශීතකරණ;


(ඈ) ශීතකරණ කාර්ය ද්විතියික වන නිෂ්පාදන (උදා: තාපාංග හෝ සිසිල් කළ ජලය බෙදාහරින උපකරණ); සහ

(ඉ) බෝතල් සිසිලන යන්ත්‍ර.

## II වන උපලේඛනය

(3 වැනි නියෝග)

1 වැනි රූපය : අවම බලශක්ති කාර්යසාධන (එම්.ඊ.පී) ලේබලය




(අ) නිශ්චිත ශීත කළ පරිමාව ලීටර්/ වොට් වලින්;

(ආ) මාසික බලශක්ති භාවිතය මසකට කිලෝවොට් පැය වලින්;

(ඇ) ක්ෂමතාව සාමාන්‍ය අගය (වොට්වලින්), මෙය (ආ) 0.72න් බෙදීමෙන් ගණනය කරනු ලබයි;

(ඈ) ශීතකාරකයේ ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමේ විභවය ($Co_2$ කිලෝග්‍රෑම්වලින්);


(ඉ) ශීතකාරකයේ ඕසෝන් ක්ෂය වීමේ විභවය (R11 ශීතකාරක මගින් ලබා දෙන);

(ඊ) භාවිත කරන ලද ශීතකාරක;


(උ) ශීතකරණයේ වෙළඳ නාමය;

(ඌ) ශීතකරණයේ මාදිලි අංකය.

2 වැනි රූපසටහන : (එම්. ඊ. පී) ලේබලයේ සැබෑ පරිමාණය -




3 වැනි රූපසටහන : (එම්. ඊ. පී) ලේබලයේ මිනුම් ප්‍රමාණයන් -





සියළුම මිනුම් මිලිමීටරවලිනි.

4 වැනි රූපසටහන : (එම්. ඊ. පී) මුද්‍රණ ස්වභාවය, ලේබලයේ අකුරුවල ප්‍රමාණයන්



5 වැනි රූපසටහන : (එම්. ඊ. පී) ලේබලයේ වර්ණ සංයෝජනය




EOG 04 - 0082